පාර්ලිමේන්තුවේ පුස්තකාලය
10 MAR 1995

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 1995 අංක 3 දරන ධීවර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1995 පෙබරවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1995 අංක 3 දරන ධීවර (සංශෝධන) පනත

**ධීවර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 09 වන දින]**

එල් ඩී.—ඕ. 56/94.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 3 දරන ධීවර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — සංක්ෂිප්ත නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර ආඥාපනතේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 212 වන අධිකාරයේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පන් සියයකට" යන වචන වෙනුවට "රුපියල් දස දහසකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පන් සියයකට" යන වචන වෙනුවට "රුපියල් දස දහසකට" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයෙහි වූ "14 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ වූ වරදක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "14 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ හැඹිලි දැල් යොදා මසුන් ඇල්ලීම තහනම් කරන යම් නියෝගයක් උල්ලංඝනය කිරීමේ වරදක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 850 කි. (විදේශීය) රු. 1,165 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා එවා ලබාගත හැකිය.